සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 07 - 2023**

## භූගෝල විද්‍යාව I

කාලය පැය 02

නම / විභාග අංකය:

**උපදෙස්:**

I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. II කොටසට වෙනම කොළයක පිළිතුරු සපයන්න. II කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

---

➢ අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01) සිතියමක වැදගත් මූලිකාංගයක් ලෙස සැළකිය හැකි පිළිතුර කුමක්ද? ..............................
(රාමුව, සංකේත, පරිමාණය)

02) පෘථිවියේ පරිභ්‍රමණය සඳහා ගතවන කාලය කොපමණද? ............................................
(දින 365, දින 365 පැය 6 යි, පැය 23 යි මිනිත්තු 56 යි.)

03) ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප අතරින් මීටර් 30 – 300 ත් අතර කලාපය හඳුන්වන නම කුමක්ද?
(මධ්‍යම කඳුකරය, වෙරළබඩ තැනිතලාව, අභ්‍යන්තර තැනිතලාව)

04) ................................. මගින් පෘථිවිය බටහිර හා නැගෙනහිර ලෙස අර්ධගෝල දෙකකට බෙදේ. (ග්‍රිනිච් රේඛාව, සමකය, සම්මත දින රේඛාව)

05) ශ්‍රී ලංකාව හරහා යන දේශාංශ රේඛා දෙක වනුයේ මොනවාද? ..............................................
(නැ.දේ. $79^0$ -- $80^0$, නැ.දේ. $80^0$ – $81^0$, නැ.දේ. $81^0$ - $82^0$)

➢ ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් ✓ ලකුණද වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06) ජාතික සිතියම් සංග්‍රහය ශ්‍රී ලංකාවේ විවිධ සිතියම් වර්ග පරිශීලනයට ඇති සුදුසුම ග්‍රන්ථයයි. (.....)

07) මඩු දේවස්ථානය ශ්‍රී ලංකාවේ ඇති ස්පෘශ්‍ය මානව නිර්මිතයකට අයත් අගමික සිද්ධස්ථානයකි. (.....)

08) මැඩගස්කර් (මැලගසි) දූපත අප්‍රිකානු මහද්වීපික තටකයේ පිහිටා ඇත. (.....)

09) දකුණු ආසියාතික රටවලින් ඉහළම සාක්ෂරතාවය සහිත රට ශ්‍රී ලංකාවයි. (.....)

10) පෘථිවියේ සමක විශ්කම්භය ධ්‍රැවක විශ්කම්භයට වඩා අඩුය. (.....)

➢ **11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

**11)** මධ්‍යම කඳුකරයේ කඳුවැටි අතරින් උතුරින්ම පිහිටි කඳු වැටිය ................................ ලෙස හැඳින්වේ.

**12)** දැදුරු ඔය හා .................................. ගඟ තෙත් කලාපය හා වියලි කලාපය වෙන් කිරීමට භාවිතා කර ඇති භෞතික සීමාවන්ය.

**13)** පෘථිවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් මිලියන ......................... පමණ වේ.

**14)** ශ්‍රී ලංකාවට අයත් දූපත් අතරින් දුරින්ම පිහිටා ඇත්තේ ................................... දූපතයි.

**15)** මුහුදු පත්ලේ ඇතිවන භූමිකම්පාවක්, නායයාමක් හෝ ගිනිකඳු පිපිරීමක් නිසා වෙරළ කරා එන වේගවත් රළ ........................... ලෙස හැඳින් වේ.

➢ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

**16)** ශ්‍රී ලංකාවට ආසන්නයේ පිහිටි දූපතක් නොවනුයේ,

**1.** ලක්ෂද්වීප **2.** සීෂෙල්ස් **3.** නිකෝබාර් **4.** සිසිලි

**17)** ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර තැනිතලාවේ පිහිටි භූ ලක්ෂණයක් දැක්වෙන පිළිතුර කුමක්ද?

**1.** කලපු **2.** සානු **3.** ශේෂ කඳු **4.** කඳු වැටි

**18)** නිරිතදිග මෝසම් වර්ෂාව ශ්‍රී ලංකාවට බලපවත්වන්නේ කවර මාස වලද?

**1.** දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා **2.** මැයි සිට සැප්තැම්බර් දක්වා

**3.** මාර්තු සිට අප්‍රේල් දක්වා **4.** ඔක්තෝම්බර් සිට නොවැම්බර් දක්වා

**19)** සංචාරක කර්මාන්තයේ දී ශ්‍රී ලාංකීය අනන්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇති සාධකය කුමක්ද?

**1.** ගනිකා වෘත්තිය **2.** ආගන්තුක සත්කාරය

**3.** දැඩි ස්වභාවික රක්ෂිත **4.** දියඇලි

**20)** පෘථිවි සාමාන්‍ය දේශගුණික රටාවේ දිගු කාලීන හා කෙටි කාලීන වෙනස්වීම් හඳුන්වනු ලබන්නේ කවර නමකින්ද?

**1.** දේශගුණය **2.** කාලගුණය **3.** දේශගුණික වෙනස්වීම **4.** කාලගුණික වෙනස්වීම්

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 07 - 2023**

## භූගෝල විද්‍යාව II

නම / විභාග අංකය:

01) අ) i. ශ්‍රී ලංකාවේ ජාතික සිතියම් සංග්‍රහයෙන් ලබා ගතහැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (2)

ii. 1: 50 000 පරිමාණයේ මෙට්‍රික් සිතියම් වල සෙ.මී. 2 න් සැබෑ භූමියේ කොපමණ දුරක් නියෝජනය කරයිද? (2)

iii. ජාතික සිතියම් සංග්‍රහයේ හඳුනාගත හැකි සිතියම් වර්ග තුනක් දක්වන්න. (3)

iv. සිතියමක් පිටපත් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුවක් සකස් කරන්න.(4)

v. කටු සිතියමක සිතියම් මූලිකාංග ඇතුලත් කර දක්වන්න. (5)

02) i. අක්ෂාංශ හා දේශාංශ හඳුන්වන්න. (2)

ii. සෙ.මී. 5 අරයක් ඇති වෘත්තයක පෘථිවි ආදර්ශ ගෝලයේ දේශාංශ රේඛා ව්‍යාප්ත වන ආකාරය ඇඳ දක්වන්න. (4)

iii. අක්ෂාංශ හා දේශාංශ වලින් ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න. (2)

iv. වැදගත් අක්ෂාංශ රේඛා තුනක් හඳුන්වන නම් අගය සමඟ දක්වන්න. (3)

03) i. ශ්‍රී ලංකාවේ හඳුනාගත හැකි විවිධ භූ දර්ශන තුනක් නම් කරන්න. (3)

ii. මීටර් 300 ට ඉහළින් පිහිටි භූ දර්ශනයේ හඳුනාගත හැකි භූ ලක්ෂණ ඇසුරින් වගුව පුරවන්න. (3)

| කඳුවැටි | සානු | කපොලු |
|---|---|---|
| | | |
| | | |
| | | |

iii. ii හිදැක්වෙන භූ දර්ශනයේ ප්‍රමුඛ ආර්ථික ක්‍රියාකාරකම් තුනක් දක්වන්න. (3)

iv. මෙම ප්‍රදේශය සංචාරක ආකර්ෂණයට හේතු වී ඇති කරුණු දෙකක් දක්වන්න. (2)

04) i. වියලි කලාපයෙන් මුහුදට ගලා බසින ගංගා තුනක් නම් කරන්න. (3)

ii. තෙත් කලාපයේ ව්‍යාප්ත නිදහස් වෙළඳ කලාප තුනක් නම් කරන්න. (3)

iii. තෙත් කලාපය ජනාකීර්ණ වීම සඳහා හේතු වී ඇති සාධක දෙකක් පෙන්වා දෙන්න. (2)

iv. තෙත් කලාපය මුහුණ දී ඇති ගැටලු තුනක් සාකච්ඡා කරන්න. (3)




05) i. මහද්වීප 4 ක් විශාලත්වය අනුව පිළිවෙළින් නම් කරන්න. (4)

ii. ඉදිරියේ ඇති සිතියමේ අංක 1,2,3,4 න් දක්වා ඇති ශ්‍රී ලංකාවේ දිග පළල මනින ස්ථාන අංක පිළිවෙළින් දක්වන්න. (4)

iii. ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප තුන ඒවා වෙන් කෙරෙන උස සමඟ දක්වන්න. (3)

06) i. ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ආකාර තුන දක්වන්න. (3)

ii. මින් එක් වර්ෂාපතන ක්‍රමයක ලක්ෂණ දෙකක් ලියන්න. (2)

iii. ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ වෙසෙන ජන වර්ග තුනක් නම් කරන්න. (3)

iv. ශ්‍රී ලංකාවේ ජාතික උරුම තුළ ස්පෘෂ්‍ය ස්වාභාවික නිර්මිත තුනක් සඳහන් කරන්න. (3)

07) පහත හරස්පද ප්‍රහෙලිකාව පුරවන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ගි | | | | | | | | 10 ක | |
| | | | | | 9 මැ | | | | |
| | | 7 ප | | 2 ම | | | | | |
| 3 සී | | | | | | | | | |
| | | | | | | | | | |
| | | 4 ම | 8 න | | | | | | |
| | 5 මා | | | | | | | | |
| | | | | 6 දි | | | | | |

<u>හරහට</u>

01) වියලි බව නිසා වනාන්තර වල ඇතිවන තත්ත්වයකි.

02) නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්කයකි.

03) අභ්‍යන්තර තැනිතලාවේ පිහිටි ශේෂ කන්දකි.

04) අක්ෂාංශ හා දේශාංශ රේඛා මෙලෙස හැඳින්වේ.

05) මිනිසා විසින් නිර්මිත.

06) මධ්‍යම කඳුකරයේ පිහිටි සංචාරක ආකර්ෂණය දිනාගත් භෞතික ලක්ෂණයකි.

<u>පහළට</u>

01) පාංශු ස්කන්ධයන් පොළොව අභ්‍යන්තරයට ගමන් කිරීම.

07) පෘථිවිය සූර්යා වටා ගමන් කිරීම

08) අලුත් යන අර්ථය දේ.

09) අප්‍රිකා මහද්වීපික තටකයේ පිහිටි දූපතකි.

10) මීගමු වෙරළ තීරයේ මෙවැන්නක් පිහිටා ඇත.

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 07 - 2023**

# භූගෝල විද්‍යාව I

පිළිතුරු පත්‍රය
ANSWER SHEET

නම / විභාග අංකයඃ

## I කොටස

01) පරිමාණය 02) දින 365 පැය 6 යි. 03) අභ්‍යන්තර තැනිතලාව 04) ග්‍රිනිච් රේඛාව 05) නැ.දේ. $80^0 - 81^0$

06) ✓ 07) ✓ 08) ✓ 09) × 10) × 11) නකල්ස් 12) වළවේ ගඟ 13) 510 14) ඩෙල්ෆ් 15) සුනාමි


16) සිසිලි 17) ශේෂ කඳු 18) මැයි සිට සැප්තැම්බර් දක්වා 19) ආගන්තුක සත්කාරය 20) දේශගුණ වෙනස්වීම්

---

## II කොටස


01) i. ශ්‍රී ලංකාවේ විවිධ තේමා සිතියම් හඳුනාගතහැකි වීම, සිතියම් ඇසුරින් දක්වා ඇති විවිධ තොරතුරු දැන ගැනීම ආදී ඕනෑම නිවැරදි පිළිතුරක් ii. කි.මී. 1 යි. iii. වර්ෂාපතන සිතියම්, දේශගුණ කලාප සිතියම්, මාර්ග සිතියම් ආදී ඕනෑම සිතියමක් iv. සව් (ට්‍රෙසින්) කඩදාසියක්, ඇමුණුම් කටු, පාදක සිතියමක්, පැන්සලක් හෝ පෑනක්, ඇඳීමේ කඩදාසියක් ආදී ඕනෑම 4 ක්

v.




02) i. පෘථිවි ආදර්ශ ගෝලයේ නැගෙනහිර සිට බටහිරට විහිදී ඇති මනඃකල්පිත රේඛා අක්ෂාංශ වේ. පෘථිවි ආදර්ශ ගෝලයේ උත්තරධ්‍රැවයේ සිට දක්ෂිණධ්‍රැවය දක්වා විහිදී ඇති මනඃකල්පිත රේඛා දේශාංශ රේඛා වේ.

ii.



iii. සිතියම් නිර්මාණය කිරීමට, කාල කලාප වෙන් කිරීමට, නිරපේක්ෂ පිහිටීම දැක්වීමට ආදී කරුණු දෙකක්

iv. සමකය අංශක 0, කර්කටක නිවර්තනය 23 1/2$^{0}$ මකර නිවර්තනය 23 1/2$^{0}$ ආර්ක්ටික් වෘත්තය 66 1/2$^{0}$ , ඇන්ටාටික් වෘත්තය 66 1/2$^{0}$ ආදී ඕනෑම තුනක්

03) i. කඳුකර භූදර්ශනය, වියලි කලාපීය භූ දර්ශනය, තෙත් කලාපීය භූ දර්ශනය, වෙරළබඩ භූ දර්ශනය ආදී

ii.

| කඳුවැටි | සානු | කපොලු |
|---|---|---|
| නකල්ස් | මහනුවර | බලන |
| දොළොස්භාගේ | වැලිමඩ | බලකඩුව |
| පිදුරුතලාගල | හැටන් | ගලගෙදර |
| හපුතලේ | කොස්ලන්ද | ගිනිගත්හේන |
| නමුණුකුල | මහවලතැන්න | හපුතලේ |

iii. තේ වගාව, සංචාරක කර්මාන්තය, එළවලු වගාව, ආදී

iv. දියඇලි, භූ ලක්ෂණ, ඓතිහාසික ස්ථාන, උද්භිද උද්‍යාන ආදී.

04) i. මහවැලි, ගල්ඔය, මැණික් ගඟ, කුඹුක්කන් ඔය, මල්වතු ඔය ආදී  ii. කටුනායක, බියගම, කොග්ගල

iii. යටිතල පහසුකම්, පරිපාලන කේන්ද්‍රස්ථානය, සේවා පහසුකම්, නාගරීකරණය ආදී

iv. ජලගැලීම් වැනි ස්වාභාවික උපද්‍රව, පරිසර දූෂණය, තදබදය, මුඩුක්කු පැල්පත්, සමාජ අපචාර ආදී...

05) i. ආසියා, අප්‍රිකා, උතුරු ඇමරිකා, දකුණු ඇමරිකා

ii. 1. පේදුරු තුඩුව, 2. දෙවුන්දර තුඩුව, 3. කොළඹ, 4.සන්ගමන්කන්ද තුඩුව

iii. වෙරළබඩ තැන්න - මීටර් 30 අඩු, අභ්‍යන්තර තැනිතලාව - මීටර් 30  300 අතර, මධ්‍යම කඳුකරය - මීටර් 300 වැඩි

06) i. සංවහන වර්ෂාව, මෝසම් වර්ෂාව, වාසුළි වර්ෂාව

ii. මෝසම් - දවස පුරා වර්ෂාව, ඊසාන හා නිරිත දිශාවන්ට වැඩි වැසි, නිශ්චිත කාලයක දී පමණක් ඇති වේ ආදී
සංවහන - ගිගිරුම් සහිත වැසි, සවස් කාලයේ පමණක් වැසි, ආදී
වාසුළි - තද සුළං සමඟ වැසි, ජල ගැලීම් ආපදා, උතුරු ප්‍රදේශයට ප්‍රබල වේ ආදී

iii. සිංහල, දමිල, මුස්ලිම්, බර්ගර්, මැලේ  iv. උණුදිය උල්පත්, දියඇලි, සිංහරාජ වනාන්තරය, ජාතික නාමල් උයන, හික්කඩුව කොරල් පර

07) හරහට - 1. ගිනිගැනීම 2. මඩකලපුව 3. සීගිරිය 4. මනඃකල්පිත 5. මානව 6. දිය ඇලි
පහළට - 1. ශිලා බැසීම 7. පරිභ්‍රමණය 8 . නව 9. මැඩගස්කරය 10. කලපුව